ශ්‍රී ලංකා
ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
පාර්ලිමේන්තුව

දේශීය ආදායම් (සංශෝධන)

2006 අංක 10 දරන දේශීය ආදායම් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා විසින්
2013 මාර්තු මස 08 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2013 පෙබරවාරි මස 26 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

[221 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ : රු. 26.00 යි **තැපැල් ගාස්තුව : රු. 10.00 යි.**

එල්.ඩී.-ඕ. 13/2013.

2006 අංක 10 දරන දේශීය ආදායම් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ.

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය.

1. (1) මේ පනත 2013 අංක දරන දේශීය ආදායම් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ:-

(2) මේ පනතේ විධිවිධාන 2013 අප්‍රේල් මස 1 වන දින සිට බලාත්මක විය යුතු ය ඃ

එසේ වුව ද -

(අ) මේ පනතේ 7 (2) වගන්තිය මගින් (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 16ඈ වගන්තියට කරන ලද සංශෝධන ;

(ආ) මේ පනතේ 8 වන වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 16ඈ වගන්තියට කරන ලද සංශෝධන; සහ

(ඇ) මේ පනතේ 10 (4) වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 17අ වගන්තියට කරන ලද සංශෝධන,

2012 අප්‍රේල් මස 1 වන දින සිට සියලු කාර්යයන් සඳහා බලාත්මක විය යුතු බවට සලකනු ලැබිය යුතු ය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම.

2. 2012 අංක 8 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:-

(1) (lxii) වන අනුඡේදයේ "ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ; සහ" යන වචන වෙනුවට "ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ; " යන වචන ආදේශ කිරීමෙන්;

(2) (lxiii) වන අනුඡේදයේ "ළමා ආරක්ෂක අධිකාරිය පනත මගින් පිහිටුවන ලද අරමුදලේ ; " යන වචන වෙනුවට "ළමා ආරක්ෂක අධිකාරිය පනත මගින් පිහිටුවන ලද අරමුදලේ ; සහ" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(3) (lxiii) වන අනුඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අනුඡේද එකතු කිරීමෙන්:-

"(lxiv) ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 26 දරන ශ්‍රී ලංකාවේ සාමාන්‍ය වෛද්‍යවරුන්ගේ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකාවේ සාමාන්‍ය වෛද්‍යවරුන්ගේ ආයතනයේ ;

(lxv) 1996 අංක 17 දරන ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ;

(lxvi) පාර්ලිමේන්තුව විසින් ඒකාබද්ධ අරමුදලින් සම්මත කරනු ලබන මුදල්වලින් හෝ ආණ්ඩුව විසින් සලස්වා දෙනු ලබන යම් ණය මුදලකින් යම් රාජ්‍ය සංස්ථාවක් විසින් ආණ්ඩුව වෙනුවෙන් නොමිලයේ සේවා සපයන තාක් දුරට ඒ රාජ්‍ය සංස්ථාවේ ;

(lxvii) ජාතික සංවර්ධන භාරකාර අරමුදල සමඟ ඒකාබද්ධ කර ඇත්තා වූ, 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සංස්ථාගත කරන ලද සීමාසහිත ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුවේ ;

(lxviii) 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ සංස්ථාගත කරන ලද සීමාසහිත ලංකාපුත්‍ර සංවර්ධන බැංකුවේ; සහ

(lxix) 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සංස්ථාගත කරනු ලැබූ පෞද්ගලික පාසල් හැර, අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ලියාපදිංචි වී ඇත්තා වූ ද, අධ්‍යාපන අමාත්‍යාංශය විසින් සකස් කරනු ලබන රජයේ විෂයමාලා සහ ඒ

අමාත්‍යාංශය විසින් නිකුත් කරනු ලබන චක්‍රලේඛ අනුගමනය කිරීමට බලය දෙනු ලැබ ඇත්තා වූ ද යම් රජයේ ආධාර ලබන පෞද්ගලික පාසලක ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය සංශෝධනය කිරීම.

3. 2011 අංක 22 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :-

(1) ඒ උපවගන්තියේ (ඈඈ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :-

"(ඈඈඈ) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමඟ ගිවිසුමකට එළඹ ඇත්තා වූ ද, අවස්ථාවෝචිත පරිදි 17අ හෝ 16ඈ වගන්ති යටතේ වූ බදු නිදහස් කාලසීමාව තුළ 2013 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව සෘජු විදේශ ආයෝජන වශයෙන් ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් මිලියන පනහකට වැඩි මුදලක් ආයෝජන කර ඇත්තා වූ ද, යම් ව්‍යවසායක් විසින් ඒ ව්‍යවසායේ කාර්ය සඳහා ශ්‍රී ලංකාවට ගෙන්වා සේවයෙහි නියුක්ත කරනු ලැබුවා වූ ද, විශේෂඥයකු වන සහ ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන යම් පුද්ගලයකු විසින්, ශ්‍රී ලංකාවේ ඒ ව්‍යවසායේ කටයුතු ඉටු කිරීමේ දී ඔහු විසින් සපයනු ලබන සේවාව අත්‍යවශ්‍ය වන බවට සහ එම සේවාව ශ්‍රී ලංකාවෙන් ලබා ගත නොහැකි බවට, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් තහවුරු කරන්නේ නම්, ඒ පුද්ගලයාට ශ්‍රී ලංකාවේ දී උද්ගත වන පඩිනඩි :

එසේ වුව ද එක් ව්‍යවසායයක සිටිය හැකි මෙම විධිවිධානය අදාළ වන විශේෂඥයන් සංඛ්‍යාව පස් දෙනෙකු නො ඉක්මවිය යුතු ය.

මේ ඡේදයේ කාර්ය සඳහා "විශේෂඥයකු" යන්නෙන්, ශ්‍රී ලංකාවේ පුරවැසියන් අතර අවශ්‍ය විශේෂඥ දැනුම ඇති විශේෂඥයන් නොමැති ක්ෂේත්‍රයක් ලෙස ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් කරනු ලබන නිර්දේශය මත, කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චය කරනු ලබන ක්ෂේත්‍රයක විශේෂඥ දැනුමක් ඇති පුද්ගලයකු අදහස් වේ .;";

(2) (ත) ඡේදයේ "ලාභ නොවන සේවා නියුක්තියෙන් ලැබෙන ලාභ" යන වචන වෙනුවට " ලාභ නොවන සේවා නියුක්තියෙන් 2013 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා ලැබෙන ලාභ" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(3) (ද) ඡේදයේ "ධූරයක් දරන්නකුට හදිසි හෝ ප්‍රමුඛතා සේවා" යන වචන වෙනුවට "ධූරයක් දරන්නකුට 2013 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා හදිසි හෝ ප්‍රමුඛතා සේවා" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ; සහ

(4) (ප) ඡේදයේ "යම් පුද්ගලයකුට ශ්‍රී ලංකාවෙහි උද්ගත වන" යන වචන වෙනුවට "යම් පුද්ගලයකුට 2013 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා ශ්‍රී ලංකාවෙහි උද්ගත වන" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්.

4. 2012 අංක 8 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තව දුරටත් සංශෝධනය කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (අ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන්:-

"(අඅ) ශ්‍රී ලංකාවේ යම් තැනැත්තකු විසින් නිකුත් කරන ලද යම් සුරැකුමක හෝ බැඳුම්කරයක, 2012 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ශ්‍රී ලංකාවට රැගෙන එන ලද විදේශ විනිමය යොදා කරන ලද ආයෝජනයකින් ශ්‍රී ලංකාවෙන් පිටත යම් තැනැත්තකුට හෝ හවුල් ව්‍යාපාරයකට හෝ පුද්ගල මණ්ඩලයකට උපචිත වන පොලිය ;";

(2) ඒ වගන්තියේ (ග) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන්:-

"(ච) (i) ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් බලපත්‍ර දී ඇති යම් කොටස් හුවමාරුවක නිල ලැයිස්තුගත යම් සාංගමික ණය සුරැකුම්පතක ; සහ

(ii) මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අනුමතය ඇතිව යම් මහ නගර සභාවක් විසින් නිකුත් කරන ලද නාගරික බැඳුම්කරයක,

2013 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසුව කරන ලද යම් ආයෝජනයකින් යම් තැනැත්තකුට උපචිත වන හෝ උද්ගත වන පොලිය හෝ වට්ටම ;".

ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය සංශෝධනය කිරීම.

5. 2012 අංක 8 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (ආආ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන්:-

"(ආආආ) ශ්‍රී ලංකාව යම් රටකින් භාණ්ඩ ප්‍රසම්පාදනය කර වෙනත් රටකට භාණ්ඩ අපනයනය කිරීමේ යම් ව්‍යාපාරයක් සම්බන්ධයෙන් 2012 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් තැනැත්තකු විසින් විදේශ ව්‍යවහාර මුදලින් උපයන ලද ලාභ සහ ආදායම ;";

(2) ඒ වගන්තියේ (ඈඈඈඈ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන්:-

"(ඈඈඈඈඈ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු වන යම් වාසික පුද්ගලයකු විසින් ශ්‍රී ලංකාවෙන් පිටත දී විදේශ ව්‍යවහාර මුදලින් උපයන ලද යම් ලාභ සහ ආදායම (ශ්‍රී ලංකාවෙන් පිටත දී දරන ලද සාධාරණ වියදම් වශයෙන් කොමසාරිස් ජනරාල්වරයා විසින් සලකනු ලබන යම් මුදලක් අඩු කිරීමෙන් පසුව) බැංකුවක් මගින් ශ්‍රී ලංකාවට ප්‍රේෂණය කරනු ලබයි නම් ඒ ලාභ සහ ආදායම ; ".

(3) ඒ වගන්තියේ (බබබබබ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන්:-

"(බබබබබබ) (i) ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව විසින් බලපත්‍ර දී ඇති යම් කොටස් හුවමාරුවක නිල ලැයිස්තුගත යම් සාංගමික ණය සුරැකුම්පතක ;

(ii) මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අනුමතය ඇතිව යම් මහ නගර සභාවක් විසින් නිකුත් කරන ලද නාගරික බැඳුම්කරයක,

2013 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසුව කරන ලද යම් ආයෝජනයකින් උපයන ලද ලාභ සහ ආදායම ;".

(4). ඒ වගන්තියේ (මමමමමම) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන්:-

"(මමමමමමම) ශ්‍රී ලංකාවෙන් පිටත දී උද්ගත වූ සෘජු විදේශීය ආයෝජනයකින් ශ්‍රී ලංකාව තුළ කරන ලද ආයෝජනය ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් මිලියන පනහක් ඉක්මවන අවස්ථාවක සහ අදාළ සේවාව ශ්‍රී ලංකාවේ දී කටයුතු කරගෙන යාම සඳහා අත්‍යවශ්‍ය බවට සහ ශ්‍රී ලංකාව තුළ ලබා ගත නොහැකි බවට ආයෝජන මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සලකනු ලබන්නේ නම්, අවස්ථාවෝචිත පරිදි 17 අ වගන්තිය යටතේ හෝ 16ඇ වගන්තිය යටතේ වන බදු නිදහස් කාලසීමාව තුළ, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය වෙත ලියාපදිංචි වී ඇති සමාගමකින් යම් විදේශීය සමාගමකට ලැබෙන යම් රාජ්‍ය භාගයක්, නියෝජිත ගාස්තුවක් හෝ යම් සැලැස්මක් සඳහා වන ගෙවීමක් ;".

ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය සංශෝධනය කිරීම.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තියේ "යම් පුද්ගලයකු විසින්" යන වචනවල සිට "රටවල් දෙකේ ම පුරවැසියකු නම්" යන වචන දක්වා ඇති සියලු වචන ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"යම් පුද්ගලයකු-

(i) එම පුද්ගලයා ශ්‍රී ලංකාවේ ද සහ වෙනත් යම් රටක ද පුරවැසියකු නම්, 2013 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා ;

(ii) එම පුද්ගලයා වෙනත් යම් රටක පුරවැසියකු නම් හා -

(අ) ඔහු ශ්‍රී ලංකාවේ පුරවැසියකු නම් ; හෝ

(ආ) ඒ වෙනත් රටේ පුරවැසිභාවය ප්‍රදානය කරනු ලැබීමෙන් පසුව ඔහුට ශ්‍රී ලංකාවේ පුරවැසිභාවය අහිමිවීමේ හේතුව මත ඔහු විසින් ශ්‍රී ලංකාවේ ස්ථිර වාසික තත්ත්වය ලබාගෙන ඇත් නම්,

2013 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන යම් තක්සෙරු වර්ෂයක් සඳහා".

ප්‍රධාන ප්‍රඥප්තියේ 16ඇ වගන්තිය සංශෝධනය කිරීම.

7. 2012 අංක 08 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 16ඇ වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ දැක්වෙන උපලේඛනයේ I වන තීරයේ "කෘෂිකර්මාන්තයට සම්බන්ධ සේවාවක් ඇතුළත් නොවන, (2) වන උපවගන්තියේ (අ) ඡේදයේ සඳහන් යම් ක්‍රියාකාරකමක් (නිෂ්පාදනයෙන් 50% කට වැඩි ප්‍රමාණයක් දේශීය වෙළඳපොළෙහි විකිණීමට අපේක්ෂිත නම්, අවම වශයෙන් 35% ක එකතු කළ අගයක් නිෂ්පාදනවල තිබිය යුතු ය.) යන වචන සහ ඉලක්කම් වෙනුවට "(2) වන උපවගන්තියේ (අ) ඡේදයේ සඳහන් යම් ක්‍රියාකාරකමක්,

යම් භාණ්ඩයක් නිෂ්පාදනය කිරීම සම්බන්ධයෙන් වන විට, නිෂ්පාදනයෙන් 50% කට වැඩි ප්‍රමාණයක් දේශීය වෙළෙඳපොළෙහි විකිණීමට අපේක්ෂිත නම්, අවම වශයෙන් 35% ක එකතු කළ අගයක් නිෂ්පාදනවල තිබිය යුතු ය." යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ; සහ

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ -

(i) ඒ උපවගන්තියේ (ආ) ඡේදයේ "ආයෝජනය කරන; සහ" යන වචන වෙනුවට "ආයෝජනය කරන;" යන වචන ආදේශ කිරීමෙන් ;

(ii) ඒ උපවගන්තියේ (ඇ) ඡේදයේ "වාණිජ කටයුතු ආරම්භ කරන," යන වචන වෙනුවට "වාණිජ කටයුතු ආරම්භ කරන; සහ" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(iii) ඒ උපවගන්තියේ (ඇ) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :-

"(ඈ) කලින් පැවති යම් ව්‍යාපාරයක් කැඩීම ප්‍රතිනිර්මාණය කිරීම හෝ අත්කර ගැනීම මගින් පිහිටුවනු නො ලැබුවා වූ ,".

ප්‍රධාන ප්‍රඥප්තියේ 16ඈ වගන්තිය සංශෝධන කිරීම.

8. 2012 අංක 8 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 16ඈ වගන්තියේ "3 වන වගන්තියේ (අ) ඡේදයේ අර්ථානුකූලව වූ ලාභ සහ ආදායම, එම ව්‍යාවසාය විසින්" යන වචන සහ ඉලක්කම් වෙනුවට "3 වන වගන්තියේ (අ) ඡේදයේ අර්ථානුකූලව වූ ලාභ සහ ආදායම එම ව්‍යවසාය කලින් පැවති යම් ව්‍යාපාරයක් කැඩීම හෝ ප්‍රතිනිර්මාණය කිරීම හෝ අත්කර ගැනීම මගින් පිහිටුවනු නො ලැබුවා වූ අවස්ථාවක දී එම ව්‍යවසාය විසින්" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

මේ වගන්තියේ කාර්ය සඳහා "ආයෝජන ප්‍රමාණය" යන්නෙන් යම් ඉඩමක, පිරියතවල, යන්ත්‍රෝපකරණවල, උපකරණවල සහ වෙනත් ස්ථාවර වත්කම්වල පිරිවැය අදහස් වේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 16ඉ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 16ඈ වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර ඒ වගන්තිය එම ප්‍රඥප්තියේ 16ඉ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය :-

"යම් පුනර්ජනනීය බලශක්ති උත්පාදක බෝග වගා කිරීමෙන් උපචිත වන සහ කාබනික පොහොර නිෂ්පාදනය කිරීම, බෙදා හැරීම සහ අලෙවි කිරීම සම්බන්ධයෙන් වන ගනුදෙනුවලින් උපචිත වන ලාභ සහ ආදායම නිදහස් කිරීම.

16ඉ. යම් තැනැත්තකුට හෝ හවුල් ව්‍යාපාරයකට (යම් ප්‍රාග්ධන වත්කමක් බැහැර කිරීමෙන් ලැබෙන ලාභ සහ ආදායම හැර) 3 වන වගන්තියේ (අ) ඡේදයේ අර්ථානුකූලව

(i) ශ්‍රී ලංකාව තුළ පුනර්ජනනීය බලශක්ති උත්පාදක බෝග වගා කිරීමේ ව්‍යවසායකින් ලැබෙන ලාභ සහ ආදායම අවුරුදු දහයක කාලයක් සඳහා, ;

(ii) කාබනික පොහොර සහ කාබනික පලිබෝධ නාශක නිෂ්පාදන කිරීම, බෙදා හැරීම සහ අලෙවි කිරීම හා සම්බන්ධ සියලු ගනුදෙනුවලින් ලැබෙන ලාභ සහ ආදායම ;

2013 අප්‍රේල් මස 1 වන දින සිට සහ ඉන් පසුව ආදායම් බද්දෙන් නිදහස් විය යුතුය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 17අ වගන්තිය සංශෝධනය කිරීම.

10. 2012 අංක 8 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 17අ වගන්තියේ (2) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :-

(1) ඒ උපවගන්තියේ (අ) ඡේදයේ (ii) වන අනුඡේදයේ ''ඇඟලුම්'' යන වචන වෙනුවට '' ඇඟලුම් සහ රෙදිපිළි'' යන වචන ආදේශ කිරීමෙන් ;

(2) ඒ උපවගන්තියේ (අ) ඡේදයේ (xxvii) අනුඡේදයේ ''නිරතව සිටින; සහ'' යන වචන වෙනුවට ''නිරතව සිටින;'' යන වචන ආදේශ කිරීමෙන් ;

(3) ඒ උපවගන්තියේ (ආ) ඡේදයේ '' වාණිජ කටයුතු ආරම්භ කරන '' යන වචන වෙනුවට ''වාණිජ කටයුතු ආරම්භ කරන; සහ '' යන වචන ආදේශ කිරීමෙන්; සහ

(4) ඒ උපවගන්තියේ (ආ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :-

''(ඇ) කලින් පැවති යම් ව්‍යාපාරයක් කැඩීම හෝ ප්‍රතිනිර්මාණය කිරීම හෝ අත්කර ගැනීම මගින් පිහිටුවනු නොලැබුවා වූ,"

මේ වගන්තියේ කාර්ය සඳහා "ආයෝජන ප්‍රමාණය" යන්නෙන් යම් ඉඩමක, පිරියතවල, යන්ත්‍රෝපකරණවල, උපකරණවල සහ වෙනත් ස්ථාවර වත්කම්වල පිරිවැය අදහස් වේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තිය සංශෝධනය කිරීම.

11. 2012 අංක 8 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ උපවගන්තියේ (අ) ඡේදයේ අතුරු විධානයේ (ඈ) ඡේදයේ "සියයට පනහක් විය යුතු ය;'' යන වචන වෙනුවට "සියයට පනහක් විය යුතුය:

එසේ වුවද, යම් වෙළෙඳාමක් හෝ ව්‍යාපාරයක් 2013 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව අත්කර ගත් යම් අධි තාක්ෂණික පිරියත, යන්ත්‍රෝපකරණ හෝ උපකරණ භාවිතයෙන් විකල්ප බලශක්ති මූලාශ්‍රවලින් වෙළඳාමේ හෝ ව්‍යාපාරයේ මුළු බලශක්ති උත්පාදන අවශ්‍යතාවලින් සියයට තිහකට වැඩි ප්‍රමාණයක් සපුරාලන අවස්ථාවක දී අනුප්‍රමාණය, අත්කර ගැනීමේ පිරිවැයෙන් සියයට සියයක් විය යුතු ය.

මේ අතුරු විධානයේ කාර්ය සඳහා " විකල්ප බලශක්ති මූලාශ්‍ර'' යන්නෙන් විදුලි බලය උත්පාදනය කරන ජාතික විදුලි බල පද්ධතිය හැර වෙනත් යම් මූලාශ්‍රයක් අදහස් වේ.

(2) ඒ උප වගන්තියේ (අ) ඡේදයේ අතුරු විධානයේ (ඈ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේද එකතු කිරීමෙන් :-

"(ඉ) තාක්ෂණය ඉහළ නැංවීමේ කාර්ය සඳහා හෝ යම් නව තාක්ෂණය හඳුන්වා දීමේ කාර්ය සඳහා 2013 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව යම් ව්‍යාපාරයක් සඳහා යම් පිරියත හෝ යන්ත්‍රෝපකරණ හෝ උපකරණ අත්කර ගෙන භාවිතා කරනු ලබන අවස්ථාවක දී අනුප්‍රමාණය, අත්කර ගැනීමේ පිරිවැයෙන් සියයට පනහක් විය යුතු ය.

(ඊ) අවදානම් කළමනාකරණ පද්ධතියට අදාළව, සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව විසින්

බලපත්‍ර දී ඇති කොළඹ කොටස් වෙළඳපොළේ අවශ්‍යතාවලට අනුකූලව, තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් ඉහළ නැංවීම සඳහා යම් කොටස් තැරැව්කාර සමාගමක් විසින් යම් පිරියත, යන්ත්‍රෝපකරණ හෝ උපකරණ අත්කර ගෙන භාවිතා කරනු ලබන අවස්ථාවක දී අනුප්‍රමාණය, අත්කර ගැනීමේ පිරිවැයෙන් සියයට සියයක් විය යුතු ය.

(උ) යම් වෙළෙඳාමක හෝ ව්‍යාපාරයක පිරිවැයෙන් අවම වශයෙන් සියයට හැටක් අපනයනවලින් ලැබෙන අවස්ථාවක හා ඒ වෙළෙඳාම හෝ ව්‍යාපාරය සඳහා 2013 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව යම් පිරියත, යන්ත්‍රෝපකරණ හෝ උපකරණ අත්කර ගෙන භාවිතා කරනු ලබන අවස්ථාවක දී, අනුප්‍රමාණය අත්කර ගැනීමේ පිරිවැයෙන් සියයට පනහක් විය යුතු ය.

(3) ඒ උපවගන්තියේ (එ) ඡේදයේ "සියයට දෙසීයට සමාන යම් ප්‍රමාණයක්'' යන වචනවල සිට " සියයට තුන්සියයකට සමාන මුදලක් විය යුතු ය; '' යන වචන දක්වා ඇති සියලු වචන ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්:-

"සියයට දෙසීයකට සමාන ප්‍රමාණයක් ඃ

එසේ වුව ද,

(අ) ඒ වියදම 2012 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව, එහෙත් 2013 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව දරන ලද අවස්ථාවක දී සහ ඒ පර්යේෂණ යම් රාජ්‍ය ආයතනයක් හරහා සිදු කරනු ලබන අවස්ථාවක දී ;

(ආ) ඒ වියදම 2013 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව දරන ලද අවස්ථාවක දී ඒ පර්යේෂණ ශ්‍රී ලංකාවේ යම් ආයතනයක් හරහා සිදු කරනු ලබන අවස්ථාවක දී ;

2012 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා ඒ අඩු කිරීම ඒ තැනැත්තා විසින් දරන ලද ඒ වියදමින් සියයට තුන්සියයකට සමාන මුදලක් විය යුතු ය.

(4) ඒ උපවගන්තියේ (ත) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන් :-

''(ද) යම් රාජ්‍ය සංස්ථාවක් හෝ රජයට අයත් ව්‍යාපාර ආයතනයක් විසින් විශේෂ බද්දක් වශයෙන් ආණ්ඩුවට ගෙවනු ලබන යම් මුදලක්.''.

ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය සංශෝධනය කිරීම.

12. 2012 අංක 8 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තියේ 1 වන උපවගන්තියේ (න) ඡේදයේ ''යම් භාණ්ඩ හෝ බඩුවල අපනයන වෙළෙඳාමට අදාළව'' යන වචන වෙනුවට '' ක්‍රීඩා විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද ජාත්‍යන්තර ක්‍රීඩා ඉසව්වල අනුග්‍රාහකත්වය සඳහා 2012 අගෝස්තු මස 1 වන දින හෝ එදිනට පසුව දරන ලද වෙළෙඳ ප්‍රචාරක දැන්වීම් සඳහා වූ වියදම් හෝ, යම් භාණ්ඩ හෝ බඩුවල අපනයන වෙළෙඳාමට අදාළව'' යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 34 වන වගන්තිය සංශෝධනය කිරීම

13. 2012 අංක 8 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 34 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :-

(1) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ (ත) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :-

''(ද) ශ්‍රී ලංකාවේ පුරවැසියකු වන හෝ ශ්‍රී ලංකාවේ වාසිකයකු වන යම් පුද්ගලයකුගේ 4 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ සඳහන් ලාභ හැර සේවා නියුක්තියෙන් ලැබෙන ලාභ 2013 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා රුපියල් ලක්ෂ පහක් ඉක්මවන අවස්ථාවක-

(i) රුපියල් ලක්ෂ පහක් ඉක්මවා ඇති එම ලාභ වල කොටස; හෝ

(ii) රුපියල් ලක්ෂ එකක්, යන මුදල් ප්‍රමාණ දෙකෙන් වඩා අඩු මුදල් ප්‍රමාණය; සහ

(ද) ශ්‍රී ලංකාවේ පුරවැසියකු වන හෝ ශ්‍රී ලංකාවේ වාසිකයකු වන යම් පුද්ගලයකුගේ 4 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ සඳහන් ලාභ හැර

(න) ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන්නා වූ ද, හා ශ්‍රී ලංකාවේ වාසිකයකු නොවන්නා වූ යම් පුද්ගලයකුට 2013 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා උපචිත වන නිල පඩිනඩිවලින් රුපියල් ලක්ෂ එකක් නොඉක්මවන කොටස. '' ; සහ

(2) ඒ වගන්තියේ (4) වන උපවගන්තියේ (අ) ඡේදයේ (i) වන අනුඡේදයේ '' (2) වන උපවගන්තියේ (අ), (ආ), (ඇ), (ඉ), (උ), (උඋ), (ඌ), (එ), (ඒ), (ඔ), (ග),(ච), (ට), (ඩ), (ණ) සහ (ත) යන ඡේදවල සඳහන්'' යන වචන සහ ඉලක්කම් වෙනුවට '' (2) වන උප වගන්තියේ (අ), (ආ), (ඇ), (ඉ), (උ), (උඋ), (ඌ), (එ),(ඒ), (ඔ),(ග), (ච), (ට), (ඩ), (ණ), (ත), (ද), සහ (න) යන ඡේදවල සඳහන් '' යන වචන ආදේශ කිරීමෙන්.

14. 2009 අංක 19 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 40අ වගන්තියේ '' සියයට විස්සක් '' යන වචන යොදා ඇති සෑම තැනක ඒ වචන වෙනුවට '' සියයට දහසයක් '' යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 40අ වන වගන්තිය සංශෝධනය කිරීම.

15. 2009 අංක 19 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 40ආ වගන්තියේ '' සියයට විස්සක් '' යන වචන යොදා ඇති සෑම තැනකම ඒ වචන වෙනුවට '' සියයට දහසයක්'' යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 40ආ වන වගන්තිය සංශෝධනය කිරීම.

16. ප්‍රධාන ප්‍රඥප්තියේ 46 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්තිය එම ප්‍රඥප්තියේ 46අ වගන්තිය ලෙස බලපැවැත්විය යුතුය :- ප්‍රධාන ප්‍රඥප්තියට 46අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම

'' කුකුළු ගොවිපළ වලින් ලැබෙන ලාභ මත ආදායම් බදු අනුප්‍රමාණය.

46අ යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් තැනැත්තකුගේ බදු අයකළ හැකි ආදායමට (යම් ප්‍රාග්ධන වත්කමක් බැහැර කිරීම මගින් ලැබෙන ලාභ සහ ආදායම් කිසිවක් හැර) 3 වන වගන්තියේ (අ) ඡේදයේ අර්ථානුකූලව කුකුළු ගොවිපළකින් ලැබෙන යම් ලාභ සහ ආදායම ඇතුළත් වන අවස්ථාවක, ඒ බදු අයකළ හැකි ආදායමෙහි ඒ ලාභ සහ ආදායම් සංයුක්ත වන කොටසින් මේ පනතේ වෙනත් විධිවිධානවල පටහැනිව කුමක් සඳහන් වුව ද, මේ පනතේ පස්වන උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන නිසි අනුප්‍රමාණය අනුව ආදායම් බදු අය කර කරනු ලැබිය යුතු ය.

මේ වගන්තියේ කාර්ය සදහා ''කුකුළු ගොවිපළකින් ලැබෙන ලාභ සහ ආදායම'' යන්නෙන්, ඒ තැනැත්තා විසින් එම නිෂ්පාදන යම් නිෂ්පාදන ක්‍රියාවලියකට හෝ සැදීමේ ක්‍රියාවලියකට භාජනය නොකර එම නිෂ්පාදන විකිණීමෙන් ලැබෙන ලාභ සහ ආදායම අදහස් වේ. ''

17. ප්‍රධාන ප්‍රඥප්තියේ 48 ආ වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර ඒ වගන්තිය එම ප්‍රඥප්තියේ 48ඇ වගන්තිය ලෙස බලපැවැත්විය යුතුය.

''ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි ව්‍යවසායවලට බදු නිදහස් කාල සීමාව අවසන් වීමෙන් පසු අදාළ වන ආදායම් බදු අනුප්‍රමාණය.

48ඇ. යම් ව්‍යවසායක් ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය පනතේ 17 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමඟ බදු සහන ලබා දෙන යම් ගිවිසුමකට ඇතුළත්ව ඇති අවස්ථාවක දී ; සහ

(අ) ඒ වගන්තිය යටතේ සලසා දී ඇති බදු නිදහස් කාල සීමාව අවසන් වීමෙන් පසු ඒ ගිවිසුම යටතේ අයකරනු ලබන බද්ද දේශීය ආදායම් පනත යටතේ අයකරනු ලබන බද්දට වඩා වැඩි අවස්ථාවක දී; හෝ

(ආ) ඒ ගිවිසුම යටතේ සලසා දී ඇති ආදායම් බදු සහන පරිපූරක ගිවිසුම් මගින් දීර්ඝ කරනු නොලබන අවස්ථාවක දී -

ඒ ව්‍යවසායේ ඒ ලාභ සහ ආදායම මත මේ පනතේ නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණය අනුව ආදායම් බදු අයකරනු ලැබිය යුතු ය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 56 වන වගන්තිය සංශෝධනය කිරීම.

18 ප්‍රධාන ප්‍රඥප්තියේ 56 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ '' සියයට පහළොවක්'' යන වචන වෙනුවට '' සියයට දොළහක් '' යන වචන ආදේශ කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ '' සියයට පහළොවක්'' යන වචන යොදා ඇති සෑම තැනක ම ඒ වචන වෙනුවට ''සියයට දොළහක් '' යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියට 56අ, 56ආ සහ 56ඇ අලුත් වගන්ති ඇතුළත් කිරීම.

19. ප්‍රධාන ප්‍රඥප්තියේ 56 වන වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර ඒ වගන්ති පිළිවෙළින් එම ප්‍රඥප්තියේ 56අ, 56ආ සහ 56ඇ වගන්ති ලෙස බලපැවැත්විය යුතු ය.

''අපනයනාභිමුඛ සමාගමක් විසින් භාණ්ඩ විකිණීමෙන් ලැබෙන ලාභ සහ ආදායම මත ආදායම් බදු අනුප්‍රමාණය.

56අ. ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය පනතේ 17 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමඟ ගිවිසුමකට ඇතුළත්ව ඇති අපනයනාභිමුඛ සමාගමක් විසින් නිෂ්පාදනය කරන භාණ්ඩ වලින් ආයෝජන මණ්ඩලය විසින් ආනයන ප්‍රතියෝජනය ලෙස අනුමත කරන ලද ප්‍රමාණය දක්වා-

(අ) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය පනතේ 17 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමඟ ගිවිසුමකට ඇතුළත්ව ඇත්තා වූ ද, මේ පනතේ 16ඈ, 16ඇ හෝ 17අ වගන්ති යටතේ හෝ 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ බදු නිදහස් කාලසීමාවක් භුක්ති විඳින්නා වූ ද, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ කාලපරිච්ඡේදය තුළ දී ඉහත කී ගිවිසුමේ විධිවිධාන යටතේ තීරු බදු රහිත පදනම මත ව්‍යාපෘතියට අදාළ භාණ්ඩ හෝ අමුද්‍රව්‍ය ආනයනය කිරීමට අවසර දෙනු ලැබ ඇත්තා වූ ද යම් සමාගමකට ; හෝ

(ආ) යම් රජයේ ආයතනයක් යටතේ තීරු බදු රහිත පදනම මත නිශ්චිත භාණ්ඩ ආනයනය කිරීමට සුදුසුකම්ලත් යම් තැනැත්තකුට, විකිණීමෙන් 2013 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා උද්ගත වන ලාභය සහ ආදායම මේ පනතේ වෙනත් යම් විධිවිධානයක පටහැනිව කුමක් සඳහන් වුව ද මේ පනතේ පස්වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උචිත අනුප්‍රමාණය අනුව ආදායම් බදු අයකරනු ලැබිය යුතු ය.

විදේශීය නැව්වලට සපයනු ලැබන භාණ්ඩ හා සේවාවලින් උපචිත වන ලාභ සහ ආදායම මත ආදායම් බදු අනුප්‍රමාණය.

56ආ. විදේශ ව්‍යවහාර මුදලින් ගෙවීම් ලැබීම සඳහා, විදේශ නැව්වලට ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරනු ලබන යම් භාණ්ඩ සැපයීම හෝ සේවා සැපයීම වෙනුවෙන් 2013 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් තැනැත්තෙකු විසින් උපයනු ලබන ලාභ සහ ආදායම, මේ පනතේ වෙනත් යම් විධිවිධානවල පටහැනිව කුමක් සඳහන් වුව ද එය නොතකා, අපනයනවලින් උද්ගත වූ ලාභ සහ ආදායම ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ අනුව ඒ ලාභ සහ ආදායමෙන් මේ පනතේ පස්වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උචිත අනුප්‍රමාණය අනුව ආදායම් බදු අයකරනු ලැබිය යුතුය.

විදේශ ව්‍යාවහාර මුදලින් ගෙවීම් ලැබීම් සඳහා, ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත භාණ්ඩ විකිණීමෙන් ලැබෙන ලාභ සහ ආදායම මත ආදායම් බදු අනුප්‍රමාණය.

56ඇ. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලය දී ඇති විදේශ විනිමය ඉපැයීම් ගිණුමක් හරහා විදේශ ව්‍යවහාර මුදලින් ගෙවීම් ලැබීම සඳහා ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත භාණ්ඩ විකිණීම මගින් 2013 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් තැනැත්තකු විසින් උපයනු ලබන ලාභ සහ ආදායම මේ පනතේ වෙනත් යම් විධිවිධානවල පටහැනිව කුමක් සඳහන් වුව ද එය නොතකා, අපනයනවලින් උද්ගත වූ ලාභ සහ ආදායම ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ අනුව ඒ ලාභ සහ ආදායමෙන් මේ පනතේ පස්වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උචිත අනුප්‍රමාණය අනුව ආදායම් බදු අයකරනු ලැබිය යුතු ය ".

20. 2012 අංක 8 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 59ආ වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධන කරනු ලැබේ :-

ප්‍රධාන ප්‍රඥප්තියේ 59ආ වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදය වෙනුවට පහත දැක්වෙන අලුත් ඡේදය ආදේශ කිරීමෙන් :-

"(ආ) එම තක්සේරු වර්ෂය සඳහා (යම් ප්‍රාග්ධන වත්කම් විකිණීමෙන් හැර) ලබන පිරිවැටුම-

(i) 2011 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන එහෙත් 2013 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව වූ යම් තක්සේරු වර්ෂයක් සඳහා රුපියල් මිලියන තුන්සියයක් නො ඉක්මවන ;

(ii) 2013 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා රුපියල් මිලියන පන්සියයක් නො ඉක්මවන" යම් ව්‍යවසායක් අදහස් වේ."; සහ

(2) ඒ වගන්තියේ පැති සටහන වෙනුවට පහත දැක්වෙන පැති සටහන ආදේශ කිරීමෙන් :-

"වාර්ෂික පිරිවැටුම එක්තරා මුදලක් නොඉක්මවන යම් ව්‍යාවසායකින් යම් තැනැත්තෙකු ලබන ලාභ සහ ආදායමට අදාළ අදායම් බදු අනුප්‍රමාණය."

21. ප්‍රධාන ප්‍රඥප්තියේ 59ඇ වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුලත් කරනු ලබන අතර ඒ වගන්ති පිළිවෙලින් එම ප්‍රඥප්තියේ 59ඇ සහ 59ඉ වගන්ති ලෙස බලපැවැත් විය යුතු යඃ-

ප්‍රධාන ප්‍රඥප්තියට 59ඇ සහ 59ඉ අලුත් වගන්ති ඇතුළත් කිරීම.

"කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත කර ඇති සහ ස්වකීය කොටස් පොදු මහජනතාවට නිකුත් කරනු ලබන සමාගම්වලට අදාළ ආදායම් බදු අනුප්‍රමාණ.

59 ඇ. (1). සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් බලපත්‍ර දී ඇති කොළඹ කොටස් හුවමාරුවේ 2013 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව එහෙත් 2014 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව තම කොටස් ලැයිස්තුගත කර ඇති සහ තම කොටස්වලින් සියයට විස්සකට නො අඩු කොටස් ප්‍රමාණයක් මුල් මහජන කොටස් නිකුතුව මගින් පොදු මහජනතාව වෙත නිකුත් කරනු ලබන යම් සමාගමක (යම් ප්‍රාග්ධන වත්කම් විකිණීමෙන් ලැබෙන ලාභ

සහ ආදායම හැර) 3 වන වගන්තියේ (අ) ඡේදයේ අර්ථානුකූලව වූ ලාභ සහ ආදායම මත අදාළ වන බදු අනුප්‍රමාණය, ඒ සමාගම ලැයිස්තුගත කිරීමෙන් පසුව ඒ සමාගමේ කොටස්වලින් සියයට විස්සකට නො අඩු කොටස් ප්‍රමාණයක් පොදු මහජනතාව විසින් අඛණ්ඩව දරා සිටීමට යටත්ව, එම කොටස් ලැයිස්තුගත කරන ලද තක්සේරු වර්ෂය සඳහා සහ එම තක්සේරු වර්ෂයට ඉක්බිතිව ම වූ තවත් තක්සේරු වර්ෂ දෙකක කාලයක් සඳහා සියයට පනහකින් අඩු කරනු ලැබිය යුතු ය.

(2) තක්සේරුකරුගේ මතය අනුව, (1) වන උපවගන්තියේ සඳහන් යම් සමාගමක් විසින් ස්වකීය කොටස් ලැයිස්තුගත කිරීමෙන් පසුව එළඹෙන යම් තක්සේරු වර්ෂයක දී, ඒ සමාගමේ කොටස්වලින් පොදු මහජනතාව විසින් දරා සිටින කොටස් ප්‍රමාණය සියයට විස්සකට වඩා අඩු නොවන පරිදි පවත්වාගෙන යාමට අපොහොසත් වන අවස්ථාවක දී, මේ පනතේ වෙනත් යම් විධිවිධානවල පටහැනිව කුමක් සඳහන් වුව ද එය නොතකා, (1) වන උපවගන්තිය යටතේ අඩු කරන ලද බදු මුදල නැවත තක්සේරු කරනු ලැබීමට, ගෙවනු ලැබීමට සහ අය කර ගනු ලැබීමට යටත් විය යුතු ය.

මේ වගන්තියේ කාර්ය සඳහා "පොදු මහජනතාව විසින් දරනු ලබන කොටස්" යන්නෙන්, ලැයිස්තුගත සමාගමක් සම්බන්ධයෙන් වන විට-

(අ) ඒ සමාගමේ මව් සමාගම, පාලිත සමාගමක් හෝ ආශ්‍රිත සමාගමක් හෝ යම් පාලිත සමාගම් හෝ ඒ සමාගමේ මව් සමාගමේ ආශ්‍රිත සමාගමක්;

(ආ) ඒ සමාගමේ අධ්‍යක්ෂවරුන් වශයෙන් ධූර දරමින් සිටින එහි අධ්‍යක්ෂවරුන්, ඔවුන්ගේ කලත්‍රයන් හා වයස අවුරුදු 18 ට අඩු ළමුන්;

(ඇ) ඒ සමාගමේ ප්‍රධාන විධායක නිලධාරී, ඔහුගේ කලත්‍රයා හා වයස අවුරුදු 18 ට අඩු ළමුන්; සහ

(ඇ) ඒ සමාගමේ කොටස්වලින් සියයට දහයක් හෝ ඊට වැඩි කොටස් ප්‍රමාණයක් දරන යම් තනි කොටස් හිමියකු,

විසින් සෘජුවම හෝ වක්‍රව දරන කොටස් හැර යම් තැනැත්තකු විසින් දරන ඒ සමාගමේ කොටස් අදහස් වේ.

යම් විකල්ප බලශක්ති නිපදවීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම මගින් උපචිත වන ලාභ සහ ආදායම මත ආදායම් බදු අනුප්‍රමාණය.

59 ඉ. යම් කුඩා ජල විදුලිබල ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම ඇතුළත්ව, යම් විකල්ප බලශක්ති නිපදවීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම මගින් යම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් විසින් උපයනු ලබන ලාභ සහ ආදායමෙන්, මේ පනතේ වෙනත් යම් විධිවිධානවල පටහැනිව කුමක් සඳහන් වුව ද, එය නොතකා, මේ පනතේ පස්වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උචිත අනුප්‍රමාණය අනුව ආදායම් බදු අයකරනු ලැබිය යුතු ය.

මේ වගන්තියේ කාර්ය සඳහා "කුඩා ජල විදුලිබල ව්‍යාපෘතිය" යන්නෙන් මෙගා වොට්ස් දහයකට වඩා අඩු විදුලිබලයක් නිපදවනු ලබන යම් ජල විදුලිබල ව්‍යාපෘතියක් අදහස් වේ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 60 වන වගන්තිය සංශෝධනය කිරීම.

22. 2009 අංක 19 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 60 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :-

(1) ඒ වගන්තියේ (අ) ඡේදයේ (ii) වන අනු ඡේදයේ "තොග වශයෙන් වූ කළු තේ, ක්‍රේප් රබර්, " යන වචන වෙනුවට "පැකට්ටු හෝ ඇසුරුම් ආකාරයෙන් නොවන, හා එක් එක් පැකට්ටුවක හෝ ඇසුරුමක එක් කිලෝග්‍රෑමයකට වඩා බර නොවන කළු තේ, ක්‍රේප් රබර්," යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) 16 වන වගන්තියේ සඳහන් "සඳහන් වූ අනෙක් භාණ්ඩ අදහස් වේ;" යන වචන වෙනුවට "සඳහන් වූ අනෙක් භාණ්ඩ අදහස් වන අතර ඊට තොග වශයෙන් වූ ඓන්ද්‍රීය තේ ඇතුළත් වේ." යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 78 වන වගන්තිය සංශෝධනය කිරීම.

23. 2011 අංක 22 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 78 වන වගන්තියේ (1) වන උපවගන්තිය සංශෝධනය කිරීම මගින් ඒ වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :-

(1) ඒ උපවගන්තියේ (අ) ඡේදයේ "අනෙකුත් ආදායම්; සහ" යන වචන වෙනුවට "අනෙකුත් ආදායම්‍ා; " යන වචන ආදේශ කිරීමෙන්;

(2) ඒ උපවගන්තියේ (ආ) ඡේදය වෙනුවට පහත දැක්වෙන අලුත් ඡේද ආදේශ කිරීමෙන් :-

"(ආ) 2007 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසු දිනයක සිට, එහෙත් 2013 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භවන යම් තක්සේරු වර්ෂයක් සඳහා 76 වන වගන්තියේ සඳහන් බෙදිය හැකි ලාභයේ සම්පූර්ණ මුදලේ අතිරික්තයක් වේ නම්, එම අතිරික්තය සහ රුපියල් ලක්ෂ හයකට වැඩි අනෙකුත් ආදායම් ; සහ

(ඇ) 2013 අප්‍රේල් මස 1 වන දින හෝ ඊට පසුව ආරම්භවන යම් තක්සේරු වර්ෂයක් සඳහා 76 වන වගන්තියේ සඳහන් බෙදිය හැකි ලාභයේ සම්පූර්ණ මුදලේ අතිරික්තයක් වේ නම්, එම අතිරික්තය සහ රුපියල් මිලියන එකකට වැඩි අනෙකුත් ආදායම්,".

ප්‍රධාන ප්‍රඥප්තියේ 79 වන වගන්තිය සංශෝධනය කිරීම.

24. 2008 අංක 9 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 79 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :-

(1) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ "ඒ බැහැරව සිටීම ආරම්භ කරනු ලැබුවේ යම් තක්සේරු වර්ෂයක දී ද ඒ තක්සේරු වර්ෂයේ ආරම්භයේ සිට, නිර්වාසිකයකු ලෙස සලකනු ලැබිය යුතු ය." යන වචන වෙනුවට "ඒ බැහැරව සිටීම ආරම්භ කරනු ලැබුවේ 2013 අප්‍රේල් මස 1 වන දිනයට පෙරාතුව වූ තක්සේරු වර්ෂයක් වන්නා වූ යම් තක්සේරු වර්ෂයක දී ද ඒ තක්සේරු වර්ෂයේ ආරම්භයේ සිට, නිර්වාසිකයකු ලෙස සලකනු ලැබිය යුතු ය." යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(2) ඒ වගන්තියේ (4) වන උපවගන්තියේ "දින හතක් නො ඉක්මවන එම කාලසීමාව" යන වචන වෙනුවට "2013 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව වූ යම් තක්සේරු වර්ෂයක් සඳහා වූ දින තිහක් නො ඉක්මවන එම කාලසීමාව" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 104 වන වගන්තිය සංශෝධනය කිරීම.

25. 2008 අංක 9 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 104 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :-

2) ඒ වගන්තියේ (4) වන උපවගන්තියේ "දින හතක් නො ඉක්මවන එම කාලසීමාව" යන වචන වෙනුවට "201

(1) ඒ වගන්තියේ (1) වන උප වගන්තියේ "යම් ගනුදෙනුවක දී උද්ගත වූ" යන වචන වෙනුවට "යම් අන්තර්ජාතික ගනුදෙනුවක දී උද්ගත වූ" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) වන උපවගන්තියේ "කොමසාරිස් ජනරාල්වරයා" යන වචන සඳහන්වන සෑම ස්ථානයක් සඳහාම "තක්සේරුකරු" යන වචනය ආදේශ කිරීමෙන් ;

(3) ඒ වගන්තියේ (3) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය ඇතුළත් කිරීමෙන් ;

"(3අ) මේ වගන්තියේ කාර්ය සඳහා නිර්දේශිත ආකාරයක් මත පදනම්ව අසම්බන්ධිත මිළ සම්බන්ධයෙන් යම් තැනැත්තකු සහ කොමසාරිස් ජනරාල්වරයා අතර යම් පූර්ව මිල ගිවිසුමක් ඇති කරගනු ලැබිය හැකි ය.".

(4) එම වගන්තියේ (4) වන උපවගන්තියේ -

(අ) ඒ උපවගන්තියේ (ආ) ඡේදයේ "අදාළ කරගනු ලබන මිළක් අදහස් වේ." යන වචන වෙනුවට "අදාළ කරගනු ලබන මිලක් අදහස් වේ;" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ආ) ඒ උපවගන්තියේ (ආ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේද එකතු කිරීමෙන් :-

"(ඇ) "ජාත්‍යන්තර ගනුදෙනුවක්" යන්නෙන් යම් ආශ්‍රිත හවුල් ව්‍යාපාර දෙකින් එකක් හෝ එම හවුල් ව්‍යාපාර දෙකම අනේවාසික ව්‍යාපාර වන්නා වූ ද යම් ස්පර්ශ කළ හැකි හෝ ස්පර්ශකළ නොහැකි දේපළ මිළ දී ගැනීමේ, විකිණීමේ හෝ කල්බදු කිරීමේ ස්වභාවයක් ගනු ලබන හෝ ලාභ, ආදායම්, පාඩු හෝ එම හවුල් ව්‍යාපාරයේ වත්කම් දරනු ලබන සේවා සැපයීම හෝ මුදල් ණයට දීමේ හෝ මුදල් ණයට ගැනීමේ හෝ වෙනත් යම් ගනුදෙනුවක් සිදු කරනු ලබන ආශ්‍රිත හවුල් ව්‍යාපාර දෙකක් හෝ වැඩි ගණනක් අතර සිදු වන ගනුදෙනුවක් අදහස්වන අතර එයට එවැනි ආශ්‍රිත හවුල් ව්‍යාපාර දෙකක් හෝ වැඩි ගණනක් අතර සිදුවන යම් අන්‍යොන්‍ය ගිවිසුමක් හෝ වැඩපිළිවෙලක් යටතේ එවැනි එක් හෝ වැඩි හවුල් ව්‍යාපාර ගණනක් සඳහා සපයනු ලබන හෝ සැපයීමට නියමිත යම් ප්‍රතිලාභයක්, සේවයක් හෝ පහසුකමක් හා සම්බන්ධයෙන් දරනු ලැබූ යම් පිරිවැයක හෝ වියදමක් සඳහා වූ යම් වෙනස් කිරීමක් බෙදා ගැනීමක්, හෝ දායකත්වයක් ඇතුළත් වේ;

(ඈ) ව්‍යාපාර දෙකින් එකක් අනේවාසික වූ ද, ආශ්‍රිත හවුල් ව්‍යාපාරයක් නොවන්නා වූ ද යම් හවුල් ව්‍යාපාරයක් විසින් යම් තැනැත්තකු සමග ඇතුළත් වූ යම් ගණනුදෙනුවක්, (1) වන වගන්තියේ සඳහන් සියලු කාර්ය සඳහා, එම හවුල් ව්‍යාපාරය සහ වෙනත් තැනැත්තන් අතර පූර්ව ගිවිසුමක් ඇත්නම් සහ එමගින් එකී ගනුදෙනුව පිළිබඳ නියමයන් මගින් ගෙවිය යුතු බදු මුදල් ප්‍රමාණය අඩු වීම හෝ අඩු වීමට බලපාන ප්‍රතිඵල ඇතිකරනු ලබන ආකාරයට එම හවුල් ව්‍යාපාරය සහ වෙනත් තැනැත්තා අතර වූ එම ගනුදෙනුව තීරණය කරනු ලබන පූර්ව ගිවිසුමක් ඇත්නම්, එම ගනුදෙනුව ජාත්‍යන්තර ගනුදෙනුවක් ලෙස සලකනු ලැබිය යුතු ය.;

(ඉ) මේ උපවගන්තියේ විධිවිධානවල ව්‍යාප්තියට හානියක් නොමැතිව, ජාත්‍යන්තර ගනුදෙනුවකින් උපචිතවන යම් වියදම් හෝ පොළිය සඳහා වූ යම් දීමනාවක් අසම්බන්ධිත මිළ පිළිබඳව ද සැලකිල්ලට ගෙන තීරණය කළ යුතු වේ" සහ

(5) ඒ වගන්තියේ පැති සටහනේ සඳහන් "ගනුදෙනුවලින්" යන වචනය වෙනුවට "ජාත්‍යන්තර ගනුදෙනුවලින්" යන වචන ආදේශ කිරීමෙන් ;

ප්‍රධාන ප්‍රඥප්තියට 104 අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

26. ප්‍රධාන ප්‍රඥප්තියේ 104 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එම ප්‍රඥප්තියේ 104 අ වගන්තිය ලෙස බලාත්මක වන්නේ ය :-

ආශ්‍රිත ව්‍යවසාය අතර සිදුවන ගනුදෙනුවලින් උපචිතවන ලාභ සහ ආදායම හෝ පාඩු අසම්බන්ධිත මිල සැලකිල්ලට ගෙන තීරණය කළ යුතු බව.

104අ (1) 104 වන වගන්තියේ (1) වන උපවගන්තියේ සඳහන් ගනුදෙනු හැර, යම් ආශ්‍රිත ව්‍යවසාය දෙකක් අතර සිදුකරන ලද ගනුදෙනුවක දී උද්ගත වූ, උපයාගත් හෝ උපචිත වූ යම් ලාභය සහ ආදායම් හෝ දැරීමට සිදු වූ යම් පාඩුවක් අසම්බන්ධිත මිල සැලකිල්ලට ගෙන තීරණය කළ යුතු වේ.

(2) (1) වන උපවගන්තියේ සඳහන් ලාභ සහ ආදායම හෝ යම් පාඩුවක් අසම්බන්ධිත මිල සැලකිල්ලට ගෙන තීරණය කර නැති බව තක්සේරුකරුට පෙනී යන අවස්ථාවක දී, අවස්ථාවෝචිත පරිදි එම ලාභ සහ ආදායම හෝ පාඩුව ඇත්ත වශයෙන්ම අසම්බන්ධිත මිළ සැලකිල්ලට ගෙන තීරණය කර ඇති බවට තක්සේරුකරු සෑහීමට පත්වන පරිදි ඔප්පු කරන ලෙස තක්සේරුකරු විසින් (1) වන උපවගන්තියේ සඳහන් එම ආශ්‍රිත ව්‍යවසාය දෙකින් එකක් හෝ අනෙක් ව්‍යාපාරය හෝ ව්‍යවසාය දෙකම පවත්වාගෙන යනු ලබන තැනැත්තා වෙත ලිඛිතව නියම කරනු ලැබිය හැකි ය. එසේ ඔප්පු කිරීමට එම තැනැත්තා අපොහොසත්වන අවස්ථාවක දී, (1) වන උපවගන්තියේ සඳහන්, අවස්ථාවෝචිත පරිදි ලාභය සහ ආදායමේ හෝ පාඩුවේ ප්‍රමාණය තක්සේරුකරු විසින් ඇස්තමේන්තු කර ඒ අනුව තක්සේරුවක් කළ හැකි ය.

(3) (1) වන උපවගන්තියේ සඳහන් අසම්බන්ධිත මිල තත්කාර්ය සඳහා නියම කරනු ලබන ක්‍රම එකක් හෝ ඊට වැඩි ගණනක පදනම මත තීරණය කරනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ කාර්ය සඳහා-

(අ) යම් ව්‍යවසායක්, නියම කරනු ලැබිය හැකි ආකාරයට සහ ඒ වැනි ප්‍රමාණයකට, කෙළින් ම හෝ අන්‍යාකාරයකින් එක් මැදිහත්කරුවෙකු හෝ මැදහත්කරුවන් වැඩි ප්‍රමාණයක් හරහා වෙනත් ව්‍යවසායක් පාලනය කිරීම සම්බන්ධයෙන් සහභාගි වන්නේ නම් පළමුව සඳහන් කළ ව්‍යවසාය දෙවනුව සඳහන් කළ ව්‍යවසායේ ආශ්‍රිත ව්‍යවසායක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(ආ) "අසම්බන්ධිත මිල" යන්නෙන් ආශ්‍රිත ව්‍යවසායයන් නොවන තැනැත්තන් අතර ඇති කර ගනු ලබන ගනුදෙනුවල දී පාලනය කළ නොහැකි තත්වයන් යටතේ අදාළ කර ගනු ලබන මිළක් අදහස් වේ."

ප්‍රධාන ප්‍රඥප්තියේ 113 වන වගන්තිය සංශෝධනය කිරීම.

27. 2012 අංක 8 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 113 වන වගන්තියේ (5) වන උපවගන්තියට ඉක්බිතිවම, පහත දැක්වෙන උපවගන්තිය එකතු කිරීමෙන් එම වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :-

"(6) (5) වන උපවගන්තියේ සඳහන් ආයෝජන අරමුදලෙහි ආයෝජනය කිරීම සඳහා නියම කර ඇති යම් බැංකුවක් හෝ මූල්‍ය ආයතනයක් විසින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන මාර්ගෝපදේශවලට අනුකූලව 2013 ජූලි මස 1 වන දිනට අරමුදලේ බැරට පවතින අරමුදල්වලින් යම් කොටසක් ප්‍රයෝජනයට ගෙන නොමැති අවස්ථාවක දී, එම ශේෂය අවස්ථාවෝචිත පරිදි එම බැංකුව හෝ මූල්‍ය ආයතනය විසින් රජයට ගෙවනු ලැබිය යුතු ණය මුදලක් ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ අනුව එම ශේෂය ඒකාබද්ධ අරමුදල වෙත යොමු කරනු ලැබිය යුතු ය.".

28. ප්‍රධාන ප්‍රඥප්තියේ 121 වන වගන්තියේ (2) වන උපවගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

ප්‍රධාන ප්‍රඥප්තියේ 121 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(3) යම් තක්සේරු වර්ෂයක දී, යම් සේවා යෝජකයකු විසින් යම් ගෙවීම් කාලසීමාවක් සඳහා යම් සේවා නියුක්තිකයකුගේ පාරිශ්‍රමිකය සම්බන්ධයෙන් අඩු කළ යුතු මුදල ඉක්මවා එම සේවා නියුක්තයාගේ පාරිශ්‍රමිකයෙන් යම් ආදායම් බදු ප්‍රමාණයක් අඩු කරගෙන ඇති අවස්ථාවක දී, එම සේවා යෝජක විසින් එම තක්සේරු වර්ෂයේ හෝ එම තක්සේරු වර්ෂයෙන් පසුව එළඹෙන කාලසීමාවක් සම්බන්ධයෙන් එම සේවා නියුක්තිකයාගේ පාරිශ්‍රමිකයෙන් අඩු කළ යුතු ආදායම් බදු මුදලින් එම වැඩිපුර අය කරන ලද මුදල අඩු කරනු ලැබිය හැකි අතර, ඒ බව කොමසාරිස් ජනරාල්වරයා වෙත එම සකස් කිරීම සිදු කර සති දෙකක් ඇතුළත ඒ වූ පරිදි ම දැනුම් දිය යුතු ය. ".

29. 2011 අංක 22 දරන පනතින් අවසන්වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 135 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "එම අඩු කිරීම, එම සාංගමික ණය සුරැකුම් පත්‍රය නිකුත් කරන අවස්ථාවේ දී සිදු කළ යුතු ය" යන වචන සහ ඉලක්කම් වෙනුවට "එම අඩු කිරීම, එම සාංගමික ණය සුරැකුම් පත්‍රය නිකුත් කරන අවස්ථාවේ දී සිදු කළ යුතු ය;

ප්‍රධාන ප්‍රඥප්තියේ 135 වන වගන්තිය සංශෝධනය කිරීම.

එසේ වුව ද, -

(අ) සංශෝධන කාලසීමාව පුරා ගෙවනු ලබන චල පොළී අනුප්‍රමාණයකට ඒ සාංගමික ණය සුරැකුම්පත් නිකුත් කරන අවස්ථාවක දී, ඒ අඩුකිරීම, එවැනි එක් එක් පොළී අනුප්‍රමාණ සංශෝධන කාලසීමාවක් ආරම්භවන අවස්ථාවේ දීම සිදු කළ යුතු ය;

(ආ) යම් සාංගමික ණය සුරැකුම් පතක් 2011 අප්‍රේල් මස 1 වන දිනයට පෙරාතුව නිකුත් කරන සහ 2011 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එයට පොලිය ගෙවනු

ලබන අවස්ථාවක දී, ඒ සඳහා වූ පොලියෙන් කිසිදු ආදායම් බද්දක් අඩුකර නොමැති අවස්ථාවක දී, ඒ අඩු කිරීම ඒ පොලිය ගෙවන හෝ බැරකරන අවස්ථාවේ දී ම සිදු කළ යුතු ය."

යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය වැඩිදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 140 වන වගන්තිය සංශෝධනය කිරීම.

30. ප්‍රධාන ප්‍රඥප්තියේ 140 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ.

"(1) මේ පනත යටතේ ආදායම් බදු අයකළ යුතු තැනැත්තන්ට යම් තක්සේරු වර්ෂයක දී බැංකුවේ හෝ මූල්‍ය ආයතනයක් විසින් ගෙවනු ලබන පොළියක්" යන වචනවල සිට "ඒ ආදායම් බද්ද අඩු කළ යුතු ය" යන වචන දක්වා වූ සියලු වචන වෙනුවට "මේ පනත යටතේ ආදායම් බදු අයකළ යුතු තැනැත්තන්ට යම් තක්සේරු වර්ෂයක දී බැංකුවක් හෝ මූල්‍ය ආයතනයක් හෝ සාංගමික ණය සුරැකුම්පත් නිකුත් කරන සමාගමක් විසින් අවස්ථාවෝචිත පරිදි, ගෙවනු ලබන, බැරකරනු ලබන හෝ වට්ටම් ලබාදෙන පොලියෙන් ආදායම් බදු අඩුකිරීමට නියම කරනු ලැබ ඇති ඒ සෑම බැංකුවක් හෝ මූල්‍ය ආයතනයක් හෝ සාංගමික ණය සුරැකුම්පත් නිකුත් කරන සමාගමක් විසින් ම, ඒ ගෙවීම සම්බන්ධයෙන් අවස්ථාවෝචිත පරිදි ඒ බැංකුව හෝ මූල්‍ය ආයතනය හෝ සමාගම සහ ඒ තැනැත්තා අතර ඇතුළත් වූ යම් ගිවිසුමකට අනුකූලව ඒ තැනැත්තන්ට එක් එක් සංශෝධන කාලසීමා ආරම්භයේ දී චල පොළී අනුප්‍රමාණයට ඒ පොළිය ගෙවනු ලබන අවස්ථාවේ දී හෝ සුරැකුම්පත් කිසිවක් නිකුත් කරනු ලබන අවස්ථාවේ දී හෝ සුරැකුම්පත් කිසිවක් නිකුත් කරනු ලබන අවස්ථාවේ දී හෝ සාංගමික ණය සුරැකුම්පත් කිසිවක් නිකුත් කරනු ලබන අවස්ථාවේ දී ඒ ආදායම් බද්ද අඩු කළ යුතු ය"

යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) ඒ වගන්තියේ පැති සටහනේ "බැංකු සහ මූල්‍ය ආයතන සතු කාර්ය." යන වචන වෙනුවට "බැංකු මූල්‍ය ආයතන සහ සමාගම් සතු කාර්ය." යන වචන ආදේශ කිරීමෙන්.

31. ප්‍රධාන ප්‍රඥප්තියේ 141 වන වගන්තියේ "යම් ණය සුරැකුමක් නිකුත් කරන යම් බැංකුවක් හෝ මූල්‍ය ආයතනයක්" යන වචන වල සිට "මුදල් ප්‍රමාණයක දණ්ඩනයක්" යන වචන දක්වා වූ සියලු වචන ඉවත් කර ඒ වෙනුවට "පොලිය ගෙවන හෝ යම් ණය සුරැකුමක් නිකුත් කරන යම් බැංකුවක් හෝ මූල්‍ය ආයතනයක් හෝ ස්ථාපිත බදු ණයකර නිකුත් කරන යම් සමාගමක් විසින් 133 වන වගන්තියේ හෝ 135 වන වගන්තියේ විධිවිධානවලට අනනුකූලව බදු අඩුකර නොගන්නා බව කොමසාරිස් ජනරාල්වරයාගේ අදහස වන අවස්ථාවක ඒ පිළිබඳ හේතු දැක්වීමට අවස්ථාවෝචිත පරිදි පොළි ගෙවන හෝ ණය සුරැකුම්පත් නිකුත් කරන හෝ ස්ථාපිත බදු ණයකර නිකුත් කරන ඒ බැංකුවට, මූල්‍ය ආයතනයට හෝ ඒ සමාගමට අවස්ථාවක් ලබාදීමෙන් පසුව සහ 133 වන වගන්තියේ හෝ 135 වන තැනැත්තන්ගේ විධිවිධානවල උල්ලංඝනයක් සිදු වී තිබෙන බවට කොමසාරිස් - ජනරාල්වරයා සෑහීමට පත්වන අවස්ථාවක අවස්ථාවෝචිත පරිදි පොළිය ගෙවන හෝ එවැනි ණය සුරැකුම්පත් නිකුත් කරන හෝ ස්ථාපිත බදු ණයකර නිකුත් කරන එවැනි යම් බැංකුවකට හෝ මූල්‍ය ආයතනයකට හෝ සමාගමකට එකී වගන්තිවල විධිවිධාන උල්ලංඝනය කිරීමෙන් මගහැරෙන ලද ආදායම් බද්දමෙන් පන්සිය ගුණයකට සමාන මුදල් ප්‍රමාණයක දණ්ඩනයක් කොමසාරිස් - ජනරාල්වරයා විසින් වන නියම කරනු ලැබිය යුතු ය" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 141 වන වගන්තිය සංශෝධනය කිරීම.

32. ප්‍රධාන ප්‍රඥප්තියේ 142 වන වගන්තියේ "බැංකුවක් හෝ මූල්‍ය ආයතනයක්" යන වචන ඒ වගන්තියේ යෙදෙන සෑම අවස්ථාවකදීම ඒ වචන වෙනුවට "බැංකුවක් හෝ මූල්‍ය ආයතනයක් හෝ සමාගමක්" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 142 වන වගන්තිය සංශෝධනය කිරීම.

33. 2011 අංක 22 දරන පනතින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 163 වන වගන්තිය පහත දැක්වෙන පරිදි තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ 163 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) 163 වන වගන්තියේ (1) වන උපවගන්තියේ -

(අ) ඒ උපවගන්තියේ අතුරු විධානයේ "සැප්තැම්බර් මස" යන වචන වෙනුවට "නොවැම්බර් මස" යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) ඒ උපවගන්තියේ තවදුරටත් අතුරු විධානයේ "61 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ හෝ 62 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඇ) ඡේදය" යන වචන සහ ඉලක්කම් වෙනුවට "(1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ (i) වන අනුඡේදය හෝ 61 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදය හෝ 62 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදය" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(2) (3) වන උපවගන්තියේ (ආ) ඡේදයේ "තක්සේරු කළ හැකි ආදායමෙහි" යන වචන වෙනුවට "තක්සේරු කළ හැකි ආදායමෙහි" යන වචන ආදේශ කිරීමෙන්;

(3) ඒ වගන්තියේ (5) වන උපවගන්තියේ (අ) ඡේදය වෙනුවට පහත දැක්වෙන අලුත් ඡේදය ආදේශ කිරීමෙන්:-

"(අ) යම් තක්සේරු වර්ෂයකට ඉක්බිතිව ම එළඹෙන තක්සේරු වර්ෂයේ නොවැම්බර් මස තිස්වන දින හෝ ඊට පෙර යම් තැනැත්තකුගේ හෝ හවුල් ව්‍යාපාරයේ ආදායම් පිළිබඳ වාර්තාව ඉදිරිපත් කර ඇති එම තැනැත්තා හෝ හවුල් ව්‍යාපාරය සම්බන්ධයෙන්,

(i) ඒ තක්සේරු වර්ෂය 2013 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භවන කිසියම් තක්සේරු වර්ෂයක් වන අවස්ථාවක දී ඒ තක්සේරු වර්ෂයට ඉක්බිතිවම එළඹෙන නොවැම්බර් මස තිස්වන දින සිට වසර දෙකක කාලසීමාවක් ඉකුත්වීමෙන් පසුව; සහ

(ii) ඒ තක්සේරු වර්ෂය 2013 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භවන කිසියම් තක්සේරු වර්ෂයක් වන අවස්ථාවක දී ඒ තක්සේරු වර්ෂයට ඉක්බිතිවම එළඹෙන නොවැම්බර් මස තිස්වන දින සිට මාස දහ අටක කාලසීමාවක් ඉකුත්වීමෙන් පසුව ; සහ ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 172 වන වගන්තිය සංශෝධනය කිරීම.

34. ප්‍රධාන ප්‍රඥප්තියේ 172 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) 172 වන වගන්තියේ (2) වන උපවගන්තියේ "සමීක්ෂණ මණ්ඩලය වෙත" යන වචන වෙනුවට "2011 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව සමීක්ෂණ මණ්ඩලය වෙත හෝ 2011 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව බදු අභියාචන කොමිෂන් සභාව වෙත."; සහ යන වචන ආදේශ කිරීමෙන්.

(2) 172 වන වගන්තියේ (3) වන උපවගන්තියේ "මේ වගන්තියේ ඉහත සඳහන් විධිවිධාන යටතේ වූ සෑම අභියාචනයක් විභාග කර ඊට සුදුස්සක් කිරීම සම්බන්ධයෙන් හැකිතාක් දුරට 169 වන වගන්තියෙහි විධිවිධාන අදාළ විය යුතු ය. කොමසාරිස් - ජනරාල්වරයාගේ නියමය මගින් පනවනු ලැබුවා වූ ද අභියාචනයට විෂය වූ දණ්ඩන මුදල ස්ථිර කිරීම, අඩු කිරීම, වැඩි කිරීම, නැතහොත් අවලංගු කිරීම සමීක්ෂණ මණ්ඩලය විසින් කරනු ලැබිය හැකි ය." යන වචන සහ ඉලක්කම් වෙනුවට "මේ වගන්තියේ ඉහත සඳහන් විධිවිධාන යටතේ වූ සෑම අභියාචනයක්ම 2011 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව විභාග කර ඊට සුදුස්සක් කිරීම සම්බන්ධයෙන් හැකිතාක් දුරට 169 වන වගන්තියයේ විධිවිධාන අදාළ විය යුතු ය. කොමසාරිස් - ජනරාල්වරයාගේ නියමය මගින් පනවනු ලැබුවා වූ ද අභියාචනයට විෂය වූ දණ්ඩන මුදල, ස්ථිර කිරීම, අඩු කිරීම, වැඩි කිරීම නැතහොත් අවලංගු කිරීම අවස්ථාවෝචිත පරිදි 2011 අප්‍රේල් මස 1 වන දිනයට පෙරාතුව සමීක්ෂණ මණ්ඩලය විසින් හෝ 2011 අප්‍රේල් මස 1 වන දිනයට පසුව බදු අභියාචන කොමිෂන් සභාව විසින් කරනු ලැබිය හැකි ය."

35. 2011 අංක 22 දරන පනතේ අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 204අ වගන්තිය පහත දැක්වෙන පරිදි තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ 204 අං වගන්තිය සංශෝධනය කිරීම.

(1) "මෙම පනතේ ඕනෑම වගන්තියක් හෝ ඒ යටතේ නිකුත්කොට ඇති යම් නියෝගයක්, රීතියක් හෝ නියමයක්" යන වචන වෙනුවට "කොමසාරිස් - ජනරාල්වරයා විසින් පරිපාලනය කරන මේ පනතේ හෝ වෙනත් යම් පනතක විධිවිධානයක් හෝ ඒ යටතේ සිදුකර ඇති යම් නියෝගයක්, රීතියක් හෝ නියමයක්" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) ඒ වගන්තියේ පැති සටහනේ "පනතේ" යන වචන වෙනුවට "කොමසාරිස් ජනරාල්වරයා විසින් පරිපාලනය කරන මේ පනතේ හෝ වෙනත් යම් පනතක" යන වචන ආදේශ කිරීමෙන්.

36. ප්‍රධාන ප්‍රඥප්තියේ 208අ වගන්තියේ අවසානයට පහත දැක්වෙන වචන එකතු කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ 208 අ වගන්තිය සංශෝධනය කිරීම.

"අර්ථනිරූපණය කිරීම සඳහා කමිටුව වෙත ඉදිරිපත් කරන ලද යම් ඉල්ලීමක් ඒ ඉල්ලීම ලැබුණ දින සිට මාස හයක් ඇතුළත කමිටුව විසින් එය නිශ්චය කරනු ලැබිය යුතු ය."

37. 2012 අංක 8 දරන පනතින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 217 වන වගන්තියේ "ලාභාංශ" යන යෙදුමේ අර්ථ නිරූපණයේ (අ) ඡේදයේ (iv) වන අනුඡේදයේ "වෙනත් ආකාරයක ලාභාංශ; සහ" යන වචන වෙනුවට "වෙනත් ආකාරයක ලාභාංශ; හෝ"

ප්‍රධාන ප්‍රඥප්තියේ 217වන වගන්තිය සංශෝධනය කිරීම.

(v) සමාගමක් විසින් කොටස් හිමියන්ට විකුණූ කොටස් ඔවුන්ගෙන් ආපසු ලබා ගැනීමේ දී අතිරික්තයක් පවතී නම් එහි, කොළඹ කොටස් හුවමාරුවේ දී ලැයිස්තු ගත කරන ලද ඒ කොටස්වල මිලට හෝ ඒ සමාගමේ කොටස් හිමියන් විසින් ඒ කොටස් ආපසු ලබාගැනීම අනුමත කිරීමේ රැස්වීම පවත්වන දිනය වන විට පවතින ඒ කොටස්වල වෙළඳපල වටිනාකම මත යම් කොටස් හිමියකුට ගෙවිය යුතු ය.

38. 2012 අංක 8 දරන පනතින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනයේ V වන කොටස වෙනුවට පහත දැක්වෙන උපලේඛනය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ පළවන උපලේඛනය සංශෝධනය කිරීම.

"V වන කොටස

(අ) 2013 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා	I වන කොටස, 1අ කොටස හෝ 1ආ කොටස ප්‍රකාරව, එහෙත් සියයට 20 ක උපරිමයකට යටත්ව.

(ආ) 2013 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා.	1ආ කොටස ප්‍රකාරව, එහෙත් සියයට 16 ක උපරිමයකට යටත්ව."

39. 2012 අංක 8 දරන පනතින් අවස්නවරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනයේ "අ කොටසේ 2 වන අයිතමයට පසුව ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් අයිතමය එකතු කිරීමෙන් ඒ වගන්තිය තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ. "ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය සංශෝධනය කිරීම.

"3. යම් ඒකක භාර කළමනාකරණ සමාගමක බදු අය කළ හැකි ආදායම මත

(ඇ) 2013 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භවන යම් තක්සේරු වර්ෂයක් සඳහා	"ආ කොටස ප්‍රකාරව
(ඈ) 2013 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භවන යම් තක්සේරු වර්ෂයක් සඳහා.	සියයට 10".

40. 2012 අංක 8 දරන පනතින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ පස්වන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ ප්‍රධාන ප්‍රඥප්තියේ පස්වන උපලේඛනය සංශෝධනය කිරීම

(1) ඒ උපලේඛනයේ 9 වන අයිතමයේ "ව්‍යවසා"යකින;," යන වචන වෙනුවට "ව්‍යවසායකින්;" යන වචන ආදේශ කිරීමෙන්;

(2) ඒ උපලේඛනයේ 10 වන අයිතමයේ "ව්‍යවසායකින්," යන වචන වෙනුවට "ව්‍යවසායකින්;" යන වචන ආදේශ කිරීමෙන්;

ඒ උපලේඛනයේ 22 වන අයිතමය වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන්:-

"22. 58 වන වගන්තියේ සඳහන් ලාභාංශයකට සහ ආදායම මත

සියයට 12

(අ) 2011 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භවන යම් තක්සේරු වර්ෂයක් සඳහා ලාභ සහ ආදායම් සම්බන්ධයෙන් අනුප්‍රමාණය	සියයට 15
(ආ) 2011 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භවන යම් තක්සේරු වර්ෂයක් සඳහා ලාභ සහ ආදායම් සම්බන්ධයෙන් අනුප්‍රමාණය	සියයට 12"

(4)ඒ උපලේඛනයේ 23 වන අයිතමය වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන්ය :-

"23 නැවකින් නැවකට මාරු කිරීමේ නියෝජ්‍යායතනයක-

(අ) 2011 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භවන යම් තක්සේරු වර්ෂයක් සඳහා නැවකින් නැවකට මාරුකිරීමේ නියෝජ්‍යායතන ගාස්තු ලාභ සහ ආදායම් සම්බන්ධයෙන් අනුප්‍රමාණය	සියයට 15
(ආ) 2013 අප්‍රේල් මස 1 වන දිනට පසුව ආරම්භවන යම් තක්සේරු වර්ෂයක් සඳහා	සියයට 15

(59 වන වගන්තිය)

(5) ඒ උපලේඛනයේ 40 වන අයිතමයට පසුව ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් අයිතමය එකතු කිරීමෙන් :-

"41. 46අ. වගන්තියේ සඳහන් කරන ලද කුකුලන් ඇති කිරීම සඳහා වූ ව්‍යවසායකට සම්බන්ධ යම් තැනැත්තකුට ලැබෙන ලාභ වලින් යම් කොටසකට අදාළ ආදායම් බදු අනුප්‍රමාණය.

(අ) 2013 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භවන යම් තක්සේරු වර්ෂයක් සඳහා	පළමුවන උපලේඛනය ප්‍රකාරව

(ආ) 2013 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භවන යම් තක්සේරු වර්ෂයක් සඳහා.	පුද්ගලයකු සම්බන්ධයෙන් පළමුවන උපලේඛනය ප්‍රකාරව, එහෙත් සියයට 10 ක උපරිමයකට යටත්ව සහ සමාගමක් සම්බන්ධයෙන් සියයට 10

42. 56අ වගන්තියේ සඳහන් යම් ව්‍යවසායකින් යම් තැනැතකුට ලැබෙන ලාභ සහ ආදායමට අදාළ යම් ආදායම බදු අනුප්‍රමාණය

(අ) 2013 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භවන යම් තක්සේරු වර්ෂයක් සඳහා	පළමුවන උපලේඛනය ප්‍රකාරව
(ආ) 2013 අප්‍රේල් මස 1 වන දිනට හෝ එදිනට පසුව ආරම්භවන යම් තක්සේරු වර්ෂයක් සඳහා	පුද්ගලයකු සම්බන්ධයෙන් පළමුවන උපලේඛනය ප්‍රකාරව, එහෙත් සියයට 10 ක උපරිමයකට යටත්ව සහසමාගමක් සම්බන්ධයෙන් සියයට 12

"43 56 ආ වගන්තියේ සඳහන් යම් ව්‍යවසායකින් යම් තැනැත්තකුට ලැබෙන ලාභ සහ ආදායමට අදාළ ආදායම් බදු අනුප්‍රමාණය.

(අ) 2013 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භවන යම් තක්සේරු වර්ෂයක් සඳහා	පළමුවන උපලේඛනය ප්‍රකාරව
(ආ) 2013 අප්‍රේල් මස 1 වන දිනට හෝ එදිනට පසුව ආරම්භවන යම් තක්සේරු වර්ෂයක් සඳහා	පුද්ගලයකු සම්බන්ධයෙන් පළමුවන උපලේඛනය ප්‍රකාරව, එහෙත් සියයට 10 ක උපරිමයකට යටත්ව සහසමාගමක් සම්බන්ධයෙන් සියයට 12

44. 56ඇ වගන්තියේ සඳහන් කරන ලද යම් විකල්ප බලශක්ති උත්පාදන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමේ කටයුත්තකින් යම් තැනැත්තකුට ලැබෙන ලාභ හා ආදායම්වල කොටසක් සඳහා අදාළ ආදායම් බදු අනුප්‍රමාණය.

(අ) 2013 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භවන යම් තක්සේරු වර්ෂයක් සඳහා	පළමුවන උපලේඛනය ප්‍රකාරව
(ආ) 2013 අප්‍රේල් මස 1 වන දිනට හෝ එදිනට පසුව ආරම්භවන යම් තක්සේරු වර්ෂයක් සඳහා	පුද්ගලයකු සම්බන්ධයෙන් පළමුවන උපලේඛනයේ ප්‍රකාරව, එහෙත් සියයට 10 ක උපරිමයකට යටත්ව සහ සමාගමක් සම්බන්ධයෙන් සියයට 12.

45. 59ඉ වගන්තියේ සඳහන් කරන ලද යම් ව්‍යවසායකින් යම් තැනැත්තකුට ලැබෙන ලාභ සහ අදායමට අදාළ ආදායම් බදු අනුප්‍රමාණය-

(අ) 2013 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භවන යම් තක්සේරු වර්ෂයක් සඳහා	පළමුවන උපලේඛනය ප්‍රකාරව
(ආ) 2013 අප්‍රේල් මස 1 වන දිනට හෝ එදිනට පසුව ආරම්භවන යම් තක්සේරු වර්ෂයක් සඳහා	පුද්ගලයකු සම්බන්ධයෙන් පළමුවන උපලේඛනයේ ප්‍රකාරව, එහෙත් සියයට 10 ක උපරිමයකට යටත්ව සහ සමාගමක් සම්බන්ධයෙන් සියයට 12.”

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්වියයුතු බව.

41. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.